

ශ්‍රී. බු. ව. 2556 ක්වූ පොසොන් මස කලාපය, රා. ව. 2012 ක් වූ ජුනි මස 04 වන දින

වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති
ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

බුදුහිමි පැසසූ ගිහියෙකු සතු අසිරිමත් අද්භූත කරුණු අට

(අඞ්ගුත්තර නිකායේ වේසාලික උගග සූත්‍රය ඇසුරිනි.)

ධර්මකාමී පින්වතුනි,

අද ශ්‍රී බුද්ධ පරිනිර්වාණ වර්ෂයෙන් 2556 වැන්නෙහි පොසොන් පුර පසළොස්වක පොහෝ දිනය යි. බුදු දහම රැගෙන අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන උතුමන්ගේ පැමිණීම, ලක් බුදු සසුන පිහිටුවීම, රජු ඇතුලු පිරිසට චුල්ලහත්ථි පදෝපම සූත්‍රය දේශනා කිරීම, භණ්ඩුක කුමරු පැවිදි උපසම්පදාව ලැබීම වැනි විශේෂ සිදුවීම් සිහිපත් කරන දිනය ලෙසට වැදගත් වේ.

අද මෙම දහම් පණිවුඩයට මාතෘකා කරන ලද්දේ සූත්‍රපිටකයේ "වේසාලික උගග සූත්‍රය" යි මෙම දේශනාව භාග්‍යවතුන් වහන්සේ විශාලා මහ නුවර මහවනය තුළ කූටාගාර ශාලාවේ වැඩ සිටියදී දේශනා කරන ලද්දකි. භාග්‍යවතුන් වහන්සේ දිනක් ඬඬමහණෙනි, විසාලා නුවර වාසීව සිටින උග්ග ගෘහපතියාට ආශ්චර්ය අද්භූත කරුණු අටක් තියනවා..ඬඬ ඉතා කෙටියෙන් මෙසේ වදාරා වැඩසිටි ආසනයෙන් නැගිට විහාරයට වැඩම කළහ.

පසුවදා උදෑසන එක්තරා භික්ෂූන් වහන්සේ නමක් හැඳ පෙරවා පාත්‍රය රැගෙන උගග ගෘහපතිගේ නිවසට වැඩම කොට පැනවූ ආසනයෙහි වැඩ සිට ඬඬගෘහපතිය ඊයේ භාග්‍යවතුන් වහන්සේ වදාළා ඔබ ආශ්චර්ය අද්භූත කරුණු අටකින් යුක්ත කෙනෙකු ලෙස පිළිගන්න කියලා භාග්‍යවතුන් වහන්සේ ඒ දේශනා කරපු ඔබ සතු කරුණු අට මොනවාද?ඬඬ ගෘහපතිතුමා කියනවා භාග්‍යවතුන් වන්සේ විසින් මම කිනම් ආශ්චර්ය අද්භූත දහම් අටකින් සම්පූර්ණයි කියල දේශනා කළාද කියා මා දන්නෙ නැහැ. මගේ දැනුමේ තරමට මට හිතෙන පරිදි මට ආශ්චර්යවත් අද්භූත කරුණු අටක් තියනව තමයි.

(01.) ගරු ස්වාමීනි (මා විසින් භාග්‍යවතුන් වහන්සේ පළමුකොට දැක්ක වෙලාවෙ ඒ දර්ශනය හා සමගම මගේ සිත පහන් වුනා. සැනසීමක් ඇතිවුනා. ඒ ඇතිවුනු ප්‍රසාදය මේ දැනුත් එලෙසින්ම පවතිනව. කිසිදු වෙනසක් නැහැ. ස්වාමීනි මේ මගේ පළමු ආශ්චර්ය අද්භූත ධර්මය බව මට දැනෙනවා. (අයං බො මෙ හනෙත පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති)

මෙයින් පේනව බුදුරජාණන් වහන්සේගේ රූප දර්ශනය දුටු විගස පුණ්‍යවන්ත ඤාණවන්තයාට උන්වහන්සේ පිළිබඳව ඇතිවන ප්‍රසාදය. සමහරු බුදු හිමි ඇහින් දැකලත් බණ අහලත් නැවත ධර්මයෙන් ඈත්වෙනව. වෙනස් වෙනවා කලකදී පැහැදෙනවා. කලකදී අපැහැදෙනවා. එහෙම අය අදත් ඉන්නවා.

දෙවන පෑතිස් මහරජතුමා ළඟත් මෙම පළමු අද්භූත ආශ්චර්ය ස්වභාවය තිබිල තියෙනවා. මිහිඳු මහරහතන් වහන්සේගේ දර්ශනයෙන්ම පැහැදීමක් ඇතිකර ගත්තා. එයින් හැඟෙනුයේ ''ධම්ම රාජසස සාවකා'' ධර්මරාජයන්ගේ ශ්‍රාවකයෙක් යනුවෙන් පවසන විටම බුදුරජාණන් වහන්සේ පිළිබඳව ප්‍රසාදයක් ඇති කරගත්ත එතුමා එසේ නොවන්නට අප රටේ ජනතාවට මේ සැනසීම කවදා ලැබේ ද?

එදා උගග ගෘහපතිතුමා බුදුරජාණන් වහන්සේ දුටු විගසම මේ අරහත් වූ සම්මා සම්බුද්ධ විජ්ජාචරණ ..... ආදී වූ ගුණයෙන් යුතු උතුමෙක්ය යන අදහස පහළ වුනා හඳුනාගත්ත, හිත පැහැදුනා, ඒ පැහැදීම එහෙමමයි. මේ පළමු අසිරිමත් අද්භූත දහමයි.

(02.) ස්වාමීනි,(මම භාග්‍යවතුන් වහන්සේ පිළිබඳව පැහැදීමෙන් යුතුව ඇසුරු කළෙමි. (පසනන චිතෙතා භගවනතං පයිරුපාසති)

මට උන්වහන්සේ අනුපිළිවෙල කථාව දෙසූ සේක. දානය පිළිබඳව සීලය, ස්වර්ගය, කාමයේ ආදීනව, ළාමක බව, කිලිටි බව, නික්මීමේ ආදීනව, කියල දුන්න. එවිට උන්වහන්සේ දුටුව මා නීවරණයෙන් බැහැර වූ බව, මම සතුටින් උද්දාමයට පත් වූ බව, උන් වහන්සේ දැක්ක. ඉන්පසු සාමුක්කංසික දහම (තම නුවණින්ම දැනගත් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්‍මය) වදාළා. එය මට දැනුනෙ පිරිසිදු වස්ත්‍රයකට යම් කහටක් වර්‍ණයක් උරා ගන්නේ යම් සේද, එලෙසිනුයි. ඒ ආසනයේදීම ධර්‍ම චක්‍ෂුසය පහළ වුනා සැක නැතිවුනා. ධර්‍මාවබෝධයට වෙන පිහිටක් කොහේ හෝ නැතිබව වැටහුනා තෙරුවන් සරණ ගතවුනා බ්‍රහ්මචර්‍ය සහිත පංච ශීලයේ පිහිටියා. මේ මගේ දෙවන ආශ්චර්‍ය අද්භූත දහමයි. (අයං බො මෙ හනෙත, දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති)

මෙයින් පැහැදිලි වනුයේ එකළ ගිහියන්ගේ ස්වභාවයයි. පැවිදි ජීවිත පිළිබඳව කවර කථාද?. ප්‍රසාදය ඇතිවුනා, ඇසුරු කළා, අනුපිළිවෙල කථාව ඇසුව, අවබෝධයෙන් නීවරණ යටපත්කළා. බ්‍රහ්මචාරී වුනා. පඤ්ච ශීලය සමාදන් වුනා. අසිරිමත් අද්භූතයෙන් යුක්තයි.

(03.) ස්වාමිනි (මම ඉතා තරුණ කෙනෙක්, ඒ වාගේම තරුණ භාර්‍ය්‍යාවන් හතර දෙනෙක් හිටියා. ඒ අයට මම කිව්වා මම බඹසර සමාදන් වුනා. අද පටන් කැමති නම් මෙහිම නතර වී මගේම සහෝදරියන් සේ ඉන්න. එසේ අකමැති නම් තම ගෙවලට ඇරලවන්නම්, තව කෙනෙක් ඇයට යමෙක් අවශ්‍යයි කියයිනම්, මම ඔහුට ඇය පවරා දෙමි. එසේ කී කළ දෙටු බිරිඳ මම අසුවලාට භාර කරන්න කී විට , වමතින් ඇය ද, දකුණතින් පැන් කෙණ්ඩිය ද ගෙන ඒ පුරුෂයාට අත පැන් වඩා දුනිමි. මගේ සිතේ කිසිදු වෙනසක් වූ බවක් නොදනිමි. මේ මට දැනෙන තුන්වෙනි ආශ්චර්‍ය අද්භූත දහමයි. (අයං බො මෙ හනෙත තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති) අද ලෝකයේ හැම තැනම සැකයෙන් වෙලිල. උග්ග සිටුතුමාට පුළුවන් වුනා තම සිත තම ස්වාමි දියණියන්ට කියල දෙන්න. ස්වාමි දියණිවරුන්ව තේරුම් ගත්ත. තිදෙනෙක් දහමට කැපවුනා. දෙටු ස්වාමි දියණිය නිරවුල්ව වෙන්වී තවදුරටත් කම්සැප තුළ රැඳුනා. ඒ බිරිඳ සහ සිටුතුමා අතර සිතෙහි කහටක් ඇති නොවීමටද වගබලා ගත්ත. සිටුතුමා තුළ කිසිදු වෙනසක් ඇතිනොවීය.

(04.) ස්වාමීනි(මම හරිහම්බ කරපු සම්පත් වලින් යහපත් සිල්වත් ගුණධර්‍මයන්ගෙන් යුතු උතුමන්ට දන් දෙනවිට මෙය දෙමි, මෙය නොදෙමි. මොහුට දෙමි, මොහුට නොදෙමි, මෙපමණ දෙමි, මෙපමණ

නොදෙමි, යනාදී සිත් පහළ කර නොගෙන අසාධාරණ නොකොට සාධාරණ බෙදුම් ඇතිව දන්දෙමි. ඒ මගේ සතරවෙනි අද්භූත ධර්මයයි. (අයං බො මෙ හනෙත චතුත්ථො අච්ඡරියො අබ්භූතො ධම්මො සංවිජ්ජති)

මෙයින් අපට පැහැදිලි වන්නේ ධර්මය පිළිබඳ හැඟෑ පැහැදීමක් දැනුමක් ඇති කෙනෙකුගේ සාධාරණ ලක්ෂණයක්. දන් දීම ලේසි වැඩක් නෙවේ. එක එක අදහසින් අද කාලේ දන් දෙනව. ඉල්ලන නිසා, දොස්කියන නිසා, තත්වය රැකගන්න, මැරුණ අය කරදර කරාවි කියන බයට. මේ ආදී වශයෙන් නොයෙක් ආකාරයට දෙනවා. උග්ග සිටුතුමා කියනව "සීල ධම්මෙහි කල්‍යාණ ධම්මෙහි" ඬඬසීලයෙහි සහ යහපත් දහමක පිහිටියා වූ උතුමන්ට ඬඬ යන කාරණය මත මට සියල්ලන්ම සාධාරණයි. මාගේ ළඟ භේදයක් නැහැ. ඒ නිසා දන් දීමෙදිත් මට හිතෙනවා අඩු වැඩි සීමා කිරීම් නැතිව සාධාරණ බෙදීම් ඇති නිසා එය මගේ ආශ්චර්ය අද්භූත ධර්මයන්ගෙන් එකකි යනුවෙන්.

(05.) ස්වාමිනි (යම් හෙයකින් භික්ෂූන් වහන්සේ නමක් ඇසුරු කරයිද සකසාම ඇසුරු කරමි. මේ මගේ පස්වෙනි ආශ්චර්ය අද්භූත දහමයි. ("අයං බො මෙ හනෙත පඤ්චමො අච්ඡරියො අබ්භූතො ධම්මො සංවිජ්ජති")

මේ තමයි උග්ග සිටුතුමා භික්ෂූන් වහන්සේලා ඇසුරු කිරීම පිළිබඳ පිළිවෙත. ඬඬස්වාමීනි (මම සකසා ඇසුරු කරනව, නොසකයා අසුරු නොකරමි.ඬඬ

එයින් කියන්නේ කුමක්ද? සද්ධර්මය ඉගෙන ගන්න, චතුරාර්ය සත්‍ය අවබෝධ කරගැනීමටයි. එයින් බාහිර යම් ඇසුරක් වේනම් එය නොමනා අධාර්මික ඇසුරකි. දහමට නොගැලපේ. මෙය ගිහි අපිට ඉතා හොඳ ආදර්ශයක්. අද ස්වාමීන් වහන්සේලා ඇසුරු කරන ඇතැම් ගිහියන් මන්ත්‍රීතුමාගෙන්, ඇමතිතුමාගෙන්, රාජ්‍ය නිලතල දරන්නන්ගෙන් වැඩ කරවා ගන්න. ඔය ආදී වශයෙන් නොමනා නොහොබිනා කටයුතු කරවා ගැනීමට පෙළඹීම අද ස්වභාවයකි. බුදුහිමියන්ගේ උපදේශය එය නොවේ. භික්ෂූන් වහන්සේලා පීඩනයට ලක්නොකොට සද්ධර්මය ඉගෙන ගැනීම නිවනට යොමු වීම, භික්ෂූන් වහන්සේ ඇසුරෙහි අර්ථය විය යුතුයි.

මේ සඳහා හොඳ උදාහරණයක් අපවත් වී වදාළ පැළෑණේ ශ්‍රී වජිරඤාණ මහ නා හිමියන්, ගිහියෙක් පැමිණ නොසකසා කරන ලද ඉල්ලීමකට දුන් පිළිතුර එනම්, රැකියාවකට ඉල්ලුම්පත් යවා

පරීක්ෂණයට යාමට පෙර නා හිමියන් හමු වී දෙපාර්තමේන්තු ප්‍රධානියාට තමන් හඳුන්වා දෙන ලිපියක් ඉල්ලීය. නාහිමියන් එම ඉල්ලීම දෙවරක්ම ප්‍රතික්ෂේප කළේය. තවදුරටත් ඉල්ලන විට ඬඬමේ ලියුම මගෙන්ම ඉල්ලන්නේ ඇයි දැ යිඬඬ විමසූ හ. ඬඬනායක හාමුදුරුවනේ ඒ මහත්මයා ඔබ වහන්සේට හොඳට සලකනවා. යනුවෙන් කීය. ඊට නාහිමියන් ඬඬඔව්, හොඳට සලකනවා, හොඳටම සලකනවා. ඒ බව මාත් දන්නවා. නමුත් ඒ සලකන්නේ ඔවැනි ලියුම් කවදාවත් මම නොදෙන නිසයි... ඬඬ

මේ කාරණය මෙසේ මෙහි සටහන් කළේ ගිහි අප විසින් බුදු දහමට අනුව භික්ෂූන් වහන්සේ හා සමග පැවැතිය යුතු ආකාරය අවබෝධ කර ගැනීමටයි.

(06.) ඬඬස්වාමිනි (මාගේ හයවැනි ආශ්චර්ය අද්භූත කාරණාව ලෙසින් මම දකින්නේ මම ඒ ස්වාමීන් වහන්සේලාව ඇසුරු කරන විට ඒ ස්වාමීන් වහන්සේලා ධර්‍මය දේශනා කරනවා. ඒ ධර්‍මය සකසා අහනවා. නොසකසා නොඅසම්. ඒ හිමියන් මට බණ නොදෙසයි නම්, (නො වෙ මෙ සො ආයසමා ධම්මං දෙසෙති) මම උන්වහන්සේට ධර්‍මය දේශනා කරනවා. (අහමසස ධම්මං දෙසෙමි) මගේ මේ හයවෙනි ආශ්චය්‍ය අද්භූත දහමයි. (අයං බො මෙ හනෙත ඡටෙඨා අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති)

මේ අසිරිමත් කාරණයෙන් පේනව බුදුන් වහන්සේ ධරමාන කාලෙ ගිහි පැවිදි සම්බන්ධය තිබී ඇති ආකාරය. යම් විටක ස්වාමීන් වහන්සේ නිහඬව සිටී නම්, ගෘහපතිපතුමා තමන් ඉගෙනගත් ධර්‍මය ස්වාමීන් වහන්සේට පවසනවා. ස්වාමීන් වහන්සේ අසා සිටිනවා. අඩුපාඩු ඇතොත් දෙදෙනාම එම අඩුපාඩු හදාගන්නව. එය ශාසනයක තිබිය යුතු ලක්ෂණයක් ලෙසින් බුදු හිමියන් දකිනව. ධර්‍මාවබෝධයට ගිහි පැවිදි භේදයක් නැහැ. සද්ධර්මය විවෘතව විමසිය යුතුයි. ඒ නිසා බුදුරජාණන් වහන්සේ මේ කාරණය ආශ්චය්‍යවූ ද, අද්භූත කාරණයක් ලෙස අනුමත කරනව.

(07.) ස්වාමිනි (මගේ ළඟට දෙව්වරු එනව. එසේ පැමිණ (සවාක්ඛාතො ගහපති, භගවතො ධම්මොති) ඬඬගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්‍මය මනාකොට දෙසන ලද්දේ යඬඬ යි මට කියති. එසේ කී කල්හි මම ඒ දෙවියන්ට මෙසේ පවසනවා. ඬඬදේවතාව,(තෙපි මෙසේ කීවත් නැතත් උන්වහන්සේ ධර්‍මය මනාකොට දේශනා කරන ලද්දේමය.. ඬඬ ස්වාමීනි (දෙවියෝ මා කරා පැමිණ මෙසේ සාකච්ඡා කරනවාය. මම දෙවියන් සමග සාකච්ඡා

කරනවාය යි, ඒ හේතුවෙන් මගේ සිතෙහි උසස් වීමක් මම නොදනිමියි. මේ මා දකින මගේ හත්වෙනි ආශ්චර්යවූ අද්භූත වූ දහමයි. (''අයං බො මෙ භනෙත සතතමො අචඡරියො අබහුතො ධමෙමා සංවිජජති'')

වතීමාන කෙනෙකුට දෙවි කෙනෙක් ඇවිත් ඉහත කී කාරණය පැවසුවොත් කෙසේ ඒ පුද්ගලයා හැසිරේ ද? උග්ග සිටුතුමා කියන ලද්දේ ඬඬඔව් ඔබ කිව්වත් නැතත් මේ ධර්මය තථාගතයන් වහන්සේ මනා කොට දේශනා කරන ලද ධර්මයක් තමයි.. ඬඬ යනුවෙනි. දෙවියන්ටවත් යටත් නොවන ධර්මානුකූල භාවයක් උග්ග සිටුතුමා ළඟ පැවතුනා. ස්වාමිනි මම දෙවියන් සමග සාකච්ඡා කළත් මට මේ කාරණය පිළිබඳ කිසිදු මානයක්, ආඩම්බරයක් ඇති ඇතිවන්නේ නැහැ.

(08.) ස්වාමිනි (භාග්‍යවතුන් වහන්සේ විසින් ඕරම්භාගිය සංයෝජන ධර්ම 05ක් දේශනා කරල තියනව. එයින් ප්‍රහීන නොවූ කිසිවක් මම කෙරෙහි නොදකිමි. (''නාහං තෙසං කිඤ්චි අතතනි අපපහීනං සමනුපසසාමීති'' මාගේ මෙම අටවැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයද ඇත්තේය. (අයං බො මෙ භනෙත අට්ඨමො අචඡරියො අබහුතො ධමෙමා සංවිජජති)

ඕරම්භාගිය සංයෝජන යනු, සත්වයා සසර බැඳ තබන රැහැන් වැනි බැඳුම් 10 කි. එයින් කාම ලෝකයෙන් යටට බැඳ තබන 05 කි. එනම් සකකායදිට්ඨි, විචිකිච්ඡා, සීලබබත පරාමාස , කාමරාග, පටිඝ යන සංයෝජන ධර්ම යෝය. එය ප්‍රහීන කිරීමත් සමග අනාගාමී ඵලයට පත්වේ. ඒ අනුව උග්ග සිටුතුමා අනාගාමී ඵලලාභියෙකි. ඒ බව සූත්‍රයේ දැක්වේ.

ඬඬස්වාමීනි(මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම අටක් මා තුළ ඇතිබව මම දනිමි. භාග්‍යවතුන් වහන්සේ විසින් ඔබ වහන්සේලාට ඊයේ වදාළ මා තුළ ඇතැයි කී ආශ්චර්ය අද්භූත ධර්ම අට කුමක්දැයි මා නොදනිමි. .ඬඬඉන්පසු ඒ භික්ෂූන් වහන්සේ විශාලා නුවර වාසී උග්ග ගෘහපතිතුගේ නිවසින් පිණ්ඩපාතය පිළිගෙන, හුනස්නෙන් නැගී වැඩම කොට පිණ්ඩපාත දානය වළඳා භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණියෝ ය. වැඳ ස්වාමීනි(භාග්‍යවතුන් වහන්ස , මම අද උදේ පාන්දරින් උගග සිටුගේ නිවසට ගියා. උගග ගෘහපතිතුමා මා හට මේ මේ කාරණා ප්‍රකාශ කළාඬඬ යයි යම් කිසි කථා බහක් වූයේ ද ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළ කළේ ය.

භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, ඉතා හෙඳයි. තමන් පිළිබඳ ඔය උග්ග සිටුතුමා කියපු ආශ්චර්ය අද්භූත කාරණා අට තමයි මම විසින්

පෙරදින ප්‍රකාශ කරන ලද්දේ ද. ඒ උග්ග ගෘහපති ආශ්චර්ය අද්භූත ධර්මයන්ගෙන් යුක්තයයි අද පටන් දරාගත යුතු යයි බුදුහිමියන් වදාළ හ.

බුදුරජාණන් වහන්සේ විසින් උග්ග ගෘහපති මේ කාරණා අටෙන් යුක්ත කෙනෙක්ය යනුවෙන් පෙරදින භික්ෂූන් වහන්සේලාට දේශනා කළ බව ඔහු දන්නෙත් නැහැ. එසේ වුවද බුද්ධියේ ගැලපීමේ ස්වභාවය එයින් හැඟේ මිහිඳු මහරහතන් වහන්සේ ද අප රටට අනුබුදුවරයෙකි. උන්වහන්සේ ශ්‍රී සද්ධර්මය රැගෙන අප රටට වැඩම කොට අවුරුදු 2319 ක් පමණ වේ. මේ සූත්‍ර දේශනාවෙන් අප ගත යුතු පාඩම වන්නේ උග්ග සිටුතුමාගේ චරිතය ආදර්ශයට ගැනීමයි. එසේ ආදර්ශයට ගෙන නොසෙල්වෙන ශ්‍රද්ධාවක් ඇතිකරගෙන සීලාදී ගුණ ධර්ම දියුණු කරගෙන යෝනිසෝ මනසිකාරයේ යෙදෙමින් දෙලොව ශාන්තිය ඇතිකර ගනිමු.